93)

# "පූර්ව නව යොවුන්වියේ නාගරික බාලිකාවන්ගේ රුචිකම්"

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අධ්‍යයනාංශයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ කෘතියයි.

UCLIB
400724

පී.වී.වයි.සී.බී.වීරරත්න
(බී.ඒ. අධ්‍යාපන ඩිප්ලෝමා)

අධ්‍යාපන පීඨය,
කොළඹ මණ්ඩපය,
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

1985-06-07 දින.

CR

## සාරාංශය

"පූර්ව නව යොවුන් වියේ නාගරික බාලිකාවන්ගේ රුචිකම්" නමැති මෙම පර්යේෂණ ග්‍රන්ථයේ මූලික අරමුණ වූයේ මෙරට පූර්ව නව යොවුන් වියේ පසුවන /අවු:12-17/ දරු දැරියන්ට ම විශේෂිත වූ රුචිකම් පද්ධතියක් දිස්වේ ද යන්න අනාවරණය කරගැනීමය. එම කරුණු ඇසුරෙන් නාගරික බාලිකාවන්ට ම සුවිශේෂ වූ රුචිකම් තිබේ දැයි යන්න ගැන විමර්ශනය කිරීමට විශේෂ අවධානය යොමු කැරිණි. එම කරුණු වඩා අර්ථවත් කර ගැනීමටත්, සුවිශේෂී ලක්ෂණයන් ඉස්මතු කරලීමටත්, නාගරික බාලකයන් හා ගම්බද බාලිකාවන්ගේ රුචිකම් පිරික්සීමටත් අදහස් කරන ලදි. එහි දී මොවුන්ගේ රුචිකම්වල සමානතා හා විෂමතාවන් හෙළිදරව් කර ගැනීම පිණිස සැසඳීමක් ද කරනු ලැබිය. අනතුරුව, සමස්තයක් වශයෙන් මේ රුචිකම් මොවුන්ගේ පෞද්ගලික, අධ්‍යාපනික, විවේකය හා විනෝදය, වෘත්තිය හා ආගමික අංශයන් කෙරෙහි බලපාන ආකාරය ගැන විමසුම් කරන ලදි. මේ කරුණු ආශ්‍රිතව විශේෂයෙන් ම, නාගරික බාලිකාවන්ගේ රුචිකම් අනුව ඔවුන් විවේකය අර්ථවත් හා බුද්ධිමත් ලෙස ගත කිරීමට ඉවහල් වන්නේ දැයි විමසා බැලූ අතර, එබඳු අවස්ථාවල දී හිතකර තත්ව වර්ධනයටත්, අහිතකර තත්ව මඟ හැරීමටත් ප්‍රතිකර්ම යෝජනා කිරීම ද කරන ලදි.

පූර්ව නව යෞවනයන්ට ම විශේෂිත වූ රුචිකම් තිබේදැයි විමර්ශනය කිරීම පිණිස ප්‍රාරම්භක අවස්ථාවේ "මගේ ආශාවන්" යන මාතෘකාව යටතේ, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කයන්හි පාසල් කීපයක නගරබද බාලක බාලිකාවන් හා ගම්බද බාලක බාලිකාවන් 350ක ලවා රචනා ලියවන ලදි. ඒවා සියල්ල ම අධ්‍යයනය කොට එම කරුණු අවුරුදු 12,13,14,15,16,17 නගරබද හා ගම්බද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ රුචිකම්, ආකල්ප, සිතුම් පැතුම් වෙන් වශයෙන් ගොනු කොට අනතුරුව නියමු ප්‍රශ්නාවලියක් සකස් කරන ලදි. ශ්‍රී චන්ද්‍රශේඛර මහා විද්‍යාලයේ 6 වන ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300ක් නියමු පරීක්ෂණයේ නියැදිය සඳහා ගෙන එම ප්‍රතිඵල විශ්ලේෂණය තුළින් පර්යේෂණයට අදාළ ප්‍රශ්නාවලිය සකස් කර ගැණිනි. බාලක බාලිකාවන්ගේ රුචිකම් ගොනු කොට පුළුල් වශයෙන් ඒවා මූලික මාතෘකා 5කට කාණ්ඩ කරන ලදි. පෞද්ගලික රුචිකම්, විවේකය හා විනෝදාංශ පිළිබඳ රුචිකම්, අධ්‍යාපනික අංශය පිළිබඳ රුචිකම්, වෘත්තිමය රුචිකම්, ආගමික අංශය පිළිබඳ රුචිකම් යනුවෙනි. ඉහත කී අන්දමට සකස් කර ගත් ප්‍රශ්නාවලිය


UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

ප්‍රශ්න 40කින් යුක්ත වූ අතර, එය පූර්ව නව යෞවනයන්ගේ, විශේෂයෙන් ම නාගරික බාලිකා-වන්ගේ රුචිකම් විමර්ශනය කිරීම සඳහා යොදා ගැනුණි.

මේ ප්‍රශ්නාවලිය, පර්යේෂණය සඳහා යොදා ගත් නියැදියට, කොළඹ හා කළුතර අධ්‍යාපන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් පාසල් 10ක පූර්ව නව යොවුන් වියේ /අවු:12-17/ නාගරික බාලිකාවන් 500කට දෙනු ලැබීය. ඔවුන් අධ්‍යාපනය ලබන පාසල් අයත් වන පළාත් පාලන කොට්ඨාශය අනුවද, තවත් නිර්ණායකයන් කිපයක් අනුව ද නාගරික බව තීරණය කෙරුණු අතරඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයෙන් පාසල් 6ක් ද, කළුතර දිස්ත්‍රික්කයෙන් පාසල් 4ක් ද තෝරා ගනු ලැබීය. නියැදිය සඳහා නාගරික බාලකයන් තෝරා ගැනීමේ දී ද කොළඹ හා කළුතර අධ්‍යාපන දිස්ත්‍රික්කයන්හි තෝරා ගත් පාසල් 5කින් ළමයින් 300ක් යොදා ගන්නා ලදි. නාගරික බාලකයන් තෝරා ගැනීමේ දී ද, නාගරික බව තීරණය කිරීම සඳහා ඉහත සඳහන් පියවර ම ගන්නා ලදි.

UNIVERSITY OF COLO LIBRARY SRI LANKA

ගම්බද ගැහැණු ළමයින් 200ක් ද මේ නියැදිය සඳහා තෝරා ගනු ලැබූ අතර, මේ අනුව මුළු නියැදියට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1000ක් සහභාගි වූ බව සඳහන් කළයුතුය.

මීට අමතරව, දත්ත එකතු කිරීම සඳහා අනෙකුත් මාධ්‍ය 2ක් භාවිත කරන ලදි. ප්‍රශ්නාවලියේ පරිපූරකයන් ලෙස මෙය යොදා ගැනිණි. ගුරු භවතුන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා සහ දෙමව්පියන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා එම මාධ්‍ය දෙක වේ. ප්‍රශ්නාවලියෙන් හෙළිදරව් වූ කරුණු වඩාත් අර්ථවත් කර ගැනීම පිණිස මෙම පාසල්වල ගුරු භවතුන් 20ක සහ දෙමව්පියන් 20ක සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි.

ඉහත සඳහන් මාධ්‍ය 3න් ලබාගත් දත්තයන්ට අනුව ඉතා වැදගත් තොරතුරු රැසක් අනාවරණය කෙරුණි. පූර්ව නව යෞවනයන්ට ම විශේෂිත වූ රුචිකම් පද්ධතියක් තිබෙන බව, ප්‍රශ්නාවලියේ දත්තයන් සහ දෙමව්පිය, ගුරු භවතුන්ගේ සම්මුඛ සාකච්ඡා තොරතුරු ඇසුරෙන් හෙළි විය. දත්ත විශ්ලේෂණයෙන් දී පෙර පර්යේෂණ අනුගමනය කරමින් අධ්‍යයන පහසුව තකා මෙම රුචිකම් සියල්ල ම මූලික අංශ 5ක් යටතේ කාණ්ඩ කරන ලදි. පෞද්ගලික විවේකය හා විනෝදය, අධ්‍යාපනික, වෘත්තිය හා ආගමික අංශයේ රුචිකම් යනුවෙන් ඒවා හැඳින්විය හැක. ඒ අනුව නව යෞවනයන්ගේ පෞද්ගලික රුචිකම් සමස්තයක් වශයෙන් ගත් කල, ඔවුන් මිතුරු කණ්ඩායමකට බැඳීමටත්, ඉතර ලිංගික සබඳතා පවත්වා ගැනීමටත්,

ආදරය ගැන කථා කිරීමටත්, බෙහෙවින් රුචිකම් දක්වන බව හෙළිදරව් විය. පූර්ව නව යෞවනයන්ගේ විවේකය හා විනෝදාංශ විමසුම් කිරීමේ දී ඒවායේ හුදු ලාමක ස්වභාවය හා ඔවුන්ගේ චින්තන රටාව පිළිබඳව මනා අවබෝධයක් ලැබුණි. අද පවත්නා සමාජයේ අවිවේකී තත්වය තුළින් විවේකයක් හා විනෝදයක් ලැබීමට මොවුන් දරන ප්‍රයත්නය දත්ත විශ්ලේෂණයෙන් හෙළි වූ අතර, විනෝදාංශයක් වශයෙන් බොළඳ චිත්‍රකථා කියවීමට හා රැස් කිරීමට ඔවුන් ප්‍රිය කරන ආකාරය ද මනාව කැපී පෙනුණි. තර්කනයෙන්, විද්‍යා දැනුමෙන්, විවේචනයෙන් පෝෂණය වූ වත්මන් සමාජයේ තරුණ පිරිසට විවාහක තත්වය, ලිංගික ආවේග ආදිය පිළිබඳව විවෘතවත්ව, බුද්ධිමත්ව අධ්‍යයනයෙහි යෙදීමට නිසි පිළිවෙතක් නොවීම යථෝක්ත බොළඳ චිත්‍රකථා, පසුපස අවිචාරවත්ව හඹා යාමට බලපෑ කරුණක් වී තිබෙන ආකාරය දත්තවලින් අනාවරණය විය.

තවද, මොවුන් මුහුණපාන විවිධ ගැටළු රුචිකම් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද වැඩි බලපෑමක් කරන බව දත්තවලින් හෙළි විය. මොවුන් වඩාත් ප්‍රිය කරන්නේ තාක්ෂණික, වාණිජ්‍ය හා ගිණුම්, සමාජ අධ්‍යයනය හා සෞන්දර්යය වැනි විෂයයන්ය. ගණිතය, විද්‍යාව වැනි විෂයයන්ට එතරම් රුචිකම් නොදැක්වුවත්, අනාගත ජීවිතය සාර්ථක කර ගැනීම පිණිස ඒවාට රුචිකම් දක්වන ආකාරයත්, ඉගෙනුමෙන් ඵලක් නැත කියා අතරමඟ පාසල හැරයාමට ප්‍රිය බව දක්වන ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සිතුම් පැතුම්වලිනුත් ඉතා වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි විය. මොවුන්ගේ රැකියා රුචිකත්වය විමසීමේ දී වෛද්‍ය, ඉංජිනේරු වෘත්තීන්ට මහත් ආශාවක් දක්වන අතර, ඉහළ වැටුප් ඇති රැකියා හා සමාජයේ කැපී පෙනෙන වෘත්තීන් තෝරා ගැනීම ප්‍රිය කරන බව පෙනී ගියේය. රැකියා රුචිකත්වය පිළිබඳ කරුණු සමස්තයක් වශයෙන් ගෙන විශ්ලේෂණය කිරීමේ දී පෙනී ගියේ මොවුන් නිදහස්ව ක්‍රියා කිරීමේ දැඩි ආශාව නිසා මෙබඳු රුචිකම් දක්වන බවය. ආගමික අංශයෙන් ද, කරුණු විමර්ශනය කළ විට, ඔවුන් දරන පටු ආකල්ප-ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. ආගම් ගැන සොයා බැලීමට හා ඒ ගැන තොරතුරු සෙවීමට මොවුන් රුචිකම් දැක්වුව ද, පැවිදි පක්ෂයේ අවවාද අනුශාසනා ලැබීමටත්, ආගමික සිද්ධස්ථාන ඇසුරෙන් අධ්‍යාපනයක් ලැබීමටත් මොවුන් ප්‍රිය නොකරන බව පෙනුණි.

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

පූර්ව නව යොවුන් වියේ නාගරිකබාලිකාවන් හා බාලකයන්ට ද, ගම්බද බාලිකාවන්ට ද විශේෂිත වූ රුචිකම් කීපයක් තිබෙන බව ද, එමෙන් ම සමානතා හා විෂමතාවන් ද පර්යේෂණයේ දත්තවලින් හෙළි විය. නාගරික බාලිකාවන් හා ගම්බද බාලිකාවන්ගේ පෞද්ගලික, විනෝදය, වෘත්තිය, අධ්‍යාපනික හා ආගමික යන අංශවල රුචිකම් අතර විෂමතාවන් බෙහෙවින් දක්නට ලැබුණි. බාලකයන් හා නාගරික බාලකයන්ගේ රුචිකම් බොහෝදුරට සමානත්වයක් උසුලන අතර, ගම්බද බාලිකාවන්ගේ ඇතැම් රුචිකම්වල විෂමතාවන් මනාව කැපී පෙනුණි. විශේෂයෙන් අධ්‍යාපන, වෘත්තිමය හා ආගමික රුචිකම් අංශවලය: නාගරික බාලක බාලිකාවන් පැවිදි පක්ෂයේ අනුශාසනා ලැබීමටත්, පන්සල් ආගමික සිද්ධස්ථාන ඇසුරෙන් අධ්‍යාපනයක් ලැබීමට අකමැති වුව ද: ගම්බද බාලිකාවන් එයට මහත් රුචිකම් දක්වන බව අනාවරණය විය. තවද, වෘත්තීය අංශයෙන් නාගරික බාලක බාලිකාවන්, වෛද්‍ය, ඉංජිනේරු නීතිඥ, ගණකාධිකාරි, ප්‍රිය කළත්, ගම්බද බාලිකාවන් ගුරු, හෙදි, ගායක/ගායිකාවන් වැනි වෘත්තීන්ට ප්‍රිය කරන බව පෙනුණි. අධ්‍යාපනික අංශයෙන් සමාජ අධ්‍යයනය, සිංහල, බුද්ධාගම සෞඛ්‍යය වැනි විෂයයන්ට ගම්බද දැරියන් ප්‍රිය කළ ද, නගරබද බාලක බාලිකාවන් එයට රුචිකම් නොදක්වන බව පෙනී ගියේය. මෙබඳු විෂමතාවන් දක්නට ලැබුණ ද, සමස්තයක් වශයෙන් පූර්ව නව යෞවනයන්ගේ රුචිකම් විමර්ශනය කරන විට ඔවුන් සැමට ම පොදු වූ සුවිශේෂ වූ රුචිකම් පද්ධතියක් තිබෙන බව මේ පර්යේෂණයෙන් මනා ලෙස අනාවරණය විය.

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA